# 6 එර්ත්‍යේෂණ

## 6.1 එර්ත්‍යේෂණයබ් යණු බුඹබ්ධ?

ජන මාධ්‍ය වේදියෙකුට ඔහු හෝ ඇය රැස්කරගත් තොරතුරු පිරික්සා බැලීමට, එම තොරතුරු සත්‍ය සහ නිවැරදි දැයි තීරණය කිරීම සඳහා පර්යේෂණ මහෝපකාරී වේ. එමෙන්ම ඔහු හෝ ඇයට නිරීක්ෂකයෙක් සේ අපක්ෂපාතී විනිශ්චයන් ලබාදීමට සහ කතාන්දරය පූර්ණ ලෙස හඳුනා ගැනීම උදෙසාද, පර්යේෂණ පිටුවහල් වේ. එසේම සාමාන්‍ය මහජන වේදිකාවෙහි තවමත් ලබාගත නොහැකි සහ ප්‍රවේශවීමට නොහැකි ඉතා වැදගත් තොරතුරු රාශියකට ජනමාධ්‍යවේදියාට සහ ඔහුගේ / ඇයගේ පාඨකයන් හට ප්‍රවිශ්ඨ වීමට හැක. පර්යේෂණ පරම අවශ්‍යතාවයකි. සමාජයේ සෑම පැතිකඩක්ම නියෝජනය වන අයුරින් තොරතුරු ලබා ගැනීමට පුවත්පත් කලාවේදියා තමා තුළ විශ්වාසයක් ගොඩනගා ගත යුතු වන්නේ ඔහුගේ / ඇයගේ වෘත්තීයමය රාජකාරී උද්යෝගිමත් ලෙස ඉටුකිරීම සඳහා වේ. ජනමාධ්‍ය වේදියා හට තම නිගමන වලට ස්වාධීනව එළඹ ගැනීමට හැකිවන්නේ ඔහු / ඇය කිසියම් විෂය කරුණු සෑම අංශයක්ම පර්යේෂණයට ලක්කිරීමෙනි. කිසියම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කාණ්ඩයක අවශ්‍යතාවයන් වෙනුවෙන් පෙනී සිටින, ඔවුන් වෙනුවෙන් කථා කරමින්, ඔවුන්ගේ න්‍යාය පත්‍රයට අනුකූලව තම වෘත්තිය මෙහෙයවීම සැබෑ ජනමාධ්‍ය පුවත්පත් කලාවේදීන්ට උචිත නොවනු ඇත. ගුවන්විදුලිය මුද්‍රිත මාධ්‍ය හෝ (On Line) යන මාධ්‍ය කුමන ස්වරූපයක් වුවද පර්යේෂණ සඳහා උදව්කළ යුතුමය. ජනමාධ්‍ය සංවිධාන, පර්යේෂණ දියුණු කිරීම සඳහා සහයෝගය දිය යුතුය.

## 6.2 ඔත්‍රණ් උණුසෑඃවීත්‍යණ් ත්‍ඔෑණානෑධ?

6.2.1 නව තොරතුරක් ප්‍රවෘත්ති ආයතනයට ලැබුණු විට එහි අදාළ බව එසේත් නැතිනම් එහි සම්බන්ධතාවය පරීක්ෂා කරන්න. මෙය ''ප්‍රවෘත්තියක්'' වශයෙන් සැලකීමට තරම් වැදගත් වේද? එමෙන්ම එම ප්‍රවෘත්තියට අදාළව තවදුරටත් පර්යේෂණ කිරීමට යොමුවිය යුතු වන්නේද?

6.2.2 එම තොරතුරුවල මුලාශ්‍රය ගැන සැලකිලිමත් වන්න. තොරතුරුවල මුලාශ්‍රවල විශ්වාසනීයභාවය ගැන ඔබ සෑහීමකට පත්වේද?, මුලාශ්‍රයන්හි මුලාශ්‍ර, එසේත් නැතිනම් මුලාශ්‍රවල අග මුල කෙබඳුද? මෙම මුලාශ්‍රය පෞද්ගලිකවම සිදුවීම නිරීක්ෂණයට ලක්කර තිබේද? ඔහු හෝ ඇය මෙම තොරතුරු වෙනත් අයෙකුගෙන් 03 වන පාර්ශවයකගෙන් අසා දැනගත්තේද? පෞද්ගලිකවම ඔහුට / ඇයට මේ පිළිබඳව අත්දැකීමක් විඳගෙන තිබේ. මෙම තොරතුරු ඔහුට හෝ ඇයට දැනගැනීමට ලැබුණු ආකාරය කෙසේද යන්න, එය පෞද්ගලික අත්දැකීමක් නොවන්නේ නම්, ප්‍රථම මුලාශ්‍රය කුමක්ද? / කවුද?

6.2.3 විමසන්න : මෙම මුලාශ්‍රය ස්වාධීනද? අපක්ෂපාතී ද? විශේෂ වූ මුලාශ්‍රයක් විද? පර්යේෂණයට බඳුන්වන විෂයට හෝ මාතෘකාවට මෙම මුලාශ්‍රය සම්බන්ධවන්නේ කුමන ආකාරයකින්ද?

## 6.3 ෂීධ්ජ්‍යඨ උධෘළ ත්‍තෘසෘතුසෘඃ :

පර්යේෂණය පරීක්ෂා කිරීම :
මෙම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රශ්න යොමුකිරීම. එහි සෑම දෙයක්ම අඩංගුවේද? (පංචවිද ප්‍රශ්න - කවුද? කොහේද? කුමක්ද? ඇයි? සහ කොහොමද?) යන ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇත්ද? ( පිටු 26) තොරතුරුවල අර්ථයක් තිබේද? එය තර්කානුකූලද? පැහැදිලිව ගලායන සිද්ධිදාමයක් ඇත්ද යන්න හෝ ව්‍යසනයක් වී තිබේද? මෙය සත්‍ය තොරතුරක් සේ හැගෙනවාද?

## 6.4 එර්ත්‍යේෂණ බීරීත්‍ඡ්‍යෟදී උණුගඹණ්‍ය බළ ෟුතු බ්‍රීයෘ වීළීත්‍තත

6.4.1 සැලකිල්ලට ගනු ලබන විෂය / මාතෘකාව සම්බන්ධව මෙතෙක් පළවී ඇති සෑම අදාළ තොරතුරක්ම එක්රැස් කරන්න. උදාහරණ ලෙස පුස්තකාල පරිහරණය, දත්ත බැංකු මගින්, අන්තර්ජාලය උපයෝගී කරගෙන සහ වෘත්තීමය හෝ කාර්මික ප්‍රකාශන භාවිතා කරමින් මෙම තොරතුරු සොයා ගැනීමට හැකිවේ.

6.4.2 ප්‍රශ්න යොමුකරන්න : ඇසින් දුටු සාක්ෂි විපතට පත්වූවන් (ඩසජඑසප) විශේෂඥයින් විවේචකයින් සහ අනෙකුත් ආයතන පක්ෂ සංවිධාන ප්‍රධානීන් මුලික අවස්ථාවේ ස්වාධීන මත දරණ පුද්ගලයින් සමඟ සාකච්ඡා කිරීම ඉතා යෝග්‍යයි. උදාහරණ ලෙස විෂය සම්බන්ධ ප්‍රවීණයින්. පසුව මද වශයෙන් ස්වාධීන මත දරණ තම තමන්ගේ න්‍යාය පත්‍රවලට අනුකූලව ක්‍රියා කරන පක්ෂ, ආයතන, සංවිධාන ප්‍රධානීන්, ඇසින්දුටු සාක්ෂිකරුවන් ආදිය. ඔබ අත ස්වාධීන තොරතුරු තිබෙන විට එම කරුණු විෂය සම්බන්ධව අනෙකුත් පක්ෂග්‍රාහී ලෙස කරුණු හුවා දැක්වූ අයගේ ස්ථාවරය පිළිබඳ විවේචනාත්මකව විමසීමට පහසුවන බව ඔබට වැටහෙනු ඇත.
සම්මුඛ සාකච්ඡාවලදී ස්වාධීන නොවූ අදහස් දරන අය වෙත ඉතා අසීරු ගැටළුව සහිත ප්‍රශ්න ඉදිරිපත් කිරීමට මෙමගින් පහසු වනු ඇත. මැනවින් අර්ථ විග්‍රහ කරන ලද විෂයක් හෝ මාතෘකාවක් සාකච්ඡාවට බඳුන් කිරීම සහ එම විෂය / මාතෘකාව තුළ සිටිමින් සම්මුඛ සාකච්ඡා ඉදිරියට ගෙනයාම මාධ්‍යවේදියාගේ යුතුකම සහ වගකීම වනු ඇත.

6.4.3 පෞද්ගලික නිරීක්ෂණ හෝ ස්ථාන පර්යේෂණය (යම් දෙයක් සිදුවූ ස්ථානයට ගොස් පර්යේෂණ කිරීම.) මාධ්‍යවේදියාගේ පෞද්ගලික අත්දැකීම් මේ සඳහා මහඟු දායකත්වයක් ලබාදෙන අතර, ලිපියට හෝ රචනය වර්ණවත් මෙන්ම අනුලක්ෂණද එකතුවනු ඇත.

මෙම කරුණු the-catamaran.org
ව්‍යාපෘතියේ 6 කොටසකි

ජනමාධ්‍යවේදියාට කෝපි මං :
මුද්‍රිත හා අන්තර්ජාල
වාර්තාකරණයේ මූලිකාංග

This project is funded by
the European Union

# 6

## වීබ්ෂූඨ්ය ලැයිෂ්තුන

1 නව තොරතුරුවල අදාළ බව. එම තොරතුරු මුලාශ්‍රයන්ට විශ්වාසනීයත්වය අඩංගු කරුණු නිවැරදිද සහ තර්කානුකූල  බවක් තිබේද යන්න එම තොරතුරු තුළ ඇති ගැලපීමේ ස්වභාවය සහ ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂභාවය

2 මෙම තොරතුරු පිළිබඳව තවදුරටත් පර්යේෂණ සිදුකළ යුතුද?

3 පර්යේෂණය සඳහා වු ක්‍රියා පටිපාටිය හරිහැටි ක්‍රියාත්මක වන්නේද යන්න හැකිතරම් සමීපව සිට සොයා බැලුවේද යන්න.

4 විෂය පිළිබඳව දැනටමත් පළවී තිබෙන තොරතුරු පාදකකරගෙන ඇතිතරම් පුළුල් දැක්මක් ලබාගැනිම සඳහා හරවත් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට.

5 සම්බන්ධ අදාළ / උචිත / ප්‍රස්තුත/ ඇසින් දුටු සාක්ෂිකරුවන්, ප්‍රවීණයන්, විපතට ලක්වු පුද්ගලයන්, සම්මුඛ සාකච්ඡා වලට භාජනය කළ පුද්ගලයින්, විවේචනය කරන පුද්ගලයින්, සම්මුඛ සාකච්ඡා වලට බඳුන් වී තිබේද?

6 ස්වාධීන මත දරණ අය ප්‍රථමයෙන් සම්මුඛ සාකච්ඡාවට සහභාගී වී තිබේද? මක්නිසාද යත් දුෂ්කර ප්‍රශ්න පසුව අනෙක් අයගෙන් ඇසීමට හැකිය.

7 සියලුම මුලාශ්‍රයන්හි නිවැරදිතාවය සහ විශ්වාසනීයත්වය පිළිබඳව දෙවරක් පරීක්ෂා කළේද?

8 ඉතා වැදගත් යැයි සැලකෙන තොරතුරු අවම වශයෙන් මුලාශ්‍ර දෙකකින්වත් සත්‍යභාවය / හරිවැරදි බව පරීක්ෂා කර බලා තිබේද? පුහුණු නිරීක්ෂකයෙක්ගේ තිබිය යුතු වෘත්තිමය තත්ත්වය මෙම පුවත්පත් කලාවේදියා ආරක්ෂාකර ගන්නේද යන්න.

9 යම්කිසි සිද්ධියක් ඇසු අවස්ථාවේ එහි තිබු තත්ත්වය පිළිබඳ පුවත්පත් කලාවේදියා ඇසින් දුටු සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කිරීම තුළින් එම තොරතුරු තීව්‍ර ලෙස පාඨකයාට ලැබීමට සැලැස්වීම සහ එම අත්දැකිම් කතාන්දර කීමේ රුකුලක් වන්නේ කුමන ආකාරයෙන්ද?